# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 14 දරන
# සංවර්ධන සභා
# (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1989 නොවැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1989 අංක 14 දරන සංවර්ධන සභා (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 69/88.

**1980 අංක 35 දරන සංවර්ධන සභා පනත ඉවත් කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1989 අංක 14 දරන සංවර්ධන සභා (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඩු නාමය.**

**2.** (1) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ. **1980 අංක 35 දරන පනත ඉවත් කිරීම.**

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) (මෙහි මින් මතු "ඉවත් කළ පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 17අ වගන්තිය නොකඩව බලපැවැත්විය යුතු ය. තව ද ඒ අනුව ඒ වගන්තිය යටතේ පිහිටුවන ලද සෑම ග්‍රාමෝදය මණ්ඩලයක් ම ඒ මණ්ඩලවලට ඒ වගන්තිය මගින් හෝ වෙනත් ලිඛිත නීතියක් මගින් පිරිනමන ලද හා භාර දෙන ලද (සංවර්ධන සභාවලට අදාළ බලතල හා කර්තව්‍ය හැර) බලතල හා කර්තව්‍ය නොකඩව ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කළ යුතු ය.

(ආ) ඉවත් කළ පනතේ 71 වන වගන්තිය යටතේ සාදන ලදුව මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක ව ඇත්තා වූ ද ග්‍රාමෝදය මණ්ඩලයක් විසින් කටයුතු කරගෙන යාමට හා කර්තව්‍ය ඉටුකිරීමේ පටිපාටියට අදාළ වන්නා වූ ද සියලු නියෝග නොකඩව බලපැවැත්වීම ග්‍රාමෝදය මණ්ඩලවල නිසි ක්‍රියාකාරිත්ව යට අවශ්‍ය වන තාක් දුරට ඒවා නොකඩව බලපැවැත්විය යුතු ය.

(ඇ) ඉවත් කළ පනත යටතේ පත් කරන ලද්දා වූ ද මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරය දරන්නා වූ ද සෑම දිසා ලේකම්වරයකු ම මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට මාස හයක කාල පරිච්ඡේද යක් හෝ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ඊට වැඩි කාලයක් හෝ කොමසාරිස්වරයා විසින් මේ පනත යටතේ තම කර්තව්‍ය ඉටු කිරීමේ දී හා සංවර්ධන සභා වල අයිතිවාසිකම් හා බැදීම් පළාත් පාලන ආයතනවලට පැවරීමේ දී ඔහුට සහාය වීමට නොකඩව එම ධුරය දැරිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

3. (1) (අ) ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ධුරය දරන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයකු වන්නා වූ ද සෑම නිලධරයකු හෝ සේවකයකු ම නොකඩව එම සේවයේ සාමාජිකයකු වශයෙන් සිටීමට කැමැත්ත දක්වතොත්, නොකඩව එම සේවයේ සාමාජිකයකු ව සිටිය යුතු ය.

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ කුමක් සඳහන් ව ඇත ද (අ) ඡේදයේ සඳහන් නිලධරයකු හෝ සේවකයකු නොවන්නා වූ ද, ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ සංවර්ධන සභාවක නිලධරයකු හෝ සේවකයකු වන්නා වූ ද සෑම නිලධරයකු හෝ සේවකයකු ම, ඔහු පළාත් පාලන සේවයේ සාමාජිකයකු වීමට ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම්, එම කැමැත්ත ප්‍රකාශ කළ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි එම සේවයේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක නිලධරයකු හෝ සේවකයකු වන්නා වූ සහ (ආ) ඡේදයේ සඳහන් වන්නා වූ ද පළාත් පාලන සේවයේ සාමාජිකයකු වීමට කැමැත්ත ප්‍රකාශ නොකරන්නා වූ ද නිලධරයකු හෝ සේවකයකු මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් හා පාරිතෝෂික මුදලක් ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) ඉවත් කළ පනතේ 19 වන වගන්තිය යටතේ සංවර්ධන සභාවක් විසින් පිහිටුවන ලද සංවර්ධන අරමුදලක බැරට මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී ඇති සියලු මුදල් එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන ආයතනයක අරමුදලකට මාරු වී තිබිය යුතු ය.

(3) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 16 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක—

(අ) ((2) වන උපවගන්තියේ සඳහන් දේපළ හැර) සියලු චංචල සහ නිශ්චල දේපළ ; සහ

(ආ) සියලු වත්කම් සහ බැරකම්

මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන ආයතනයට මාරු වී තිබිය යුතු ය.

(4) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 16 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවකට, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී අයවිය යුතු ව තිබුණු සියලු ණය, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන ආයතනයකට අය විය යුතු ණය වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ ණය අය කර ගනු ලැබිය හැකි ය.

(5) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 16 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක් විසින් ඇතුළත් වී, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ පවතින සියලු ගිවිසුම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන ආයතනයක් විසින් ඇතුළත් වූ ගිවිසුම් ලෙස මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා බලාත්මක කරනු ලැබිය හැකි ය.

(6) (අ) ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක් විසින් හෝ ඊට විරුද්ධ ව හෝ යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ නොනිමි ව පවතින සියලු නඩු කටයුතු මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන ආයතනය විසින් හෝ ඊට විරුද්ධ ව පවරන ලද නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා පවත්වාගෙන යා යුතු ය.

(ආ) ඉවත් කළ පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවකට පක්ෂ ව හෝ විරුද්ධ ව යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් සටහන් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන ආයතනයකට පක්ෂ ව හෝ විරුද්ධ ව සටහන් කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කළ හැකි ය.

(7) කොමසාරිස්වරයා මේ වගන්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයා විසින් අදාළ පළාත් පාලන ආයතනයෙන් විමසා පළාත් පාලන සේවාවන් වැඩිදියුණු කිරීම ගැන සැලකිලිමත් ව නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අනුකූල ව ක්‍රියා කළ යුතු ය.

(8) මේ වගන්තියෙහි—

"කොමසාරිස්වරයා" යන්නෙන් පළාත් පාලන කොමසාරිස්වරයා අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.